# කටු 15

ජගත් ජේ එදිරිසිංහ



නිරාශා දුරකතනය නිවා දැමුවේ විදුල පිළිබඳ විමසමින් වද දෙන මාධ්‍යයෙන් වසන් වනු පිණිසය. විදුල මුණසිංහ නම් වන සම්මානලාභී සිනමා අධ්‍යක්ෂවරයා මැර ප්‍රහාරයකින් අසාධ්‍ය තත්වයෙන් රෝහල් ගත කර සිටින්නේය යන ප්‍රවෘත්තිය ඉතා හොඳින් විකුණා ගත හැකි දවසේ උණුසුම් පුවත බවට පත්ව තිබීම විමතියකට පත්විය යුතු කාරණයක් නොවේ. එනමුදු ඊයේ රාත්‍රියේ සිට අනවරතව පැමිණෙමින් තිබෙන විමසීම් ඇමතුම් ඇය හෙම්බත් කොට තිබුණි.

පොලිස් මාධ්‍ය ප්‍රකාශකගේ ප්‍රකාශයක් රූපවාහිණී සේවා ඔස්සේ ප්‍රචාරය කෙරෙයි. අපරාධකරුවන් පිළිබඳ හෝඩුවාවක් ලැබී තිබෙන බවත් වැරදිකරුවන් ඉක්මණින් අත්අඩංගුවට ගන්නා බවත් ඔහුගේ ප්‍රකාශයේ සඳහන්ව තිබෙයි. ඒ ප්‍රකාශ පිළිබඳ විශ්වාසයක් නොතිබුණද අපරාධකරුවන් අල්ලා ගැනීම සඳහා යම් කිසිවක් සිදුවෙමින් පවතින්නේය යන හැඟීම පවා නිරාශාගේ සිතට ඇති කළේ සහනයකි.

මදාරා උදෑසනම නික්ම ගියේ දහවලට රෝහලට එන පොරොන්දුව පිටය. රාත්‍රිය පුරා නිදිවර්ජිතව අසා සිටි මදාරාගේ කතාවත් විදුලගේ තිර රචනයත් නිරාශා ගේ සිතේ ඇති කර තිබුණේ සුවිසල් බරකි. මදාරා නික්ම ගිය පසු විදුලගේ මේසය මත වූ තිර රචනය අතට ගත් නිරාශා එය නැවත කියවන්නට අසාර්ථක උත්සාහයක යෙදුණාය. සිත එකලස් කරගනිමින් එය කියවිය නොහැකි බව දැනුණ පසු ඈ එය නැවත මේසය මතම තබා ඔහුගේ පුටුවේ වාඩි වී කල්පනාවට බර වී බෙහෝ වේලාවක් ගත කළාය.

කාමරය පුරා විසිරී ඇති විදුලගේ පොත් පත අතර සිට ඔහු තමා දෙස බලා සිටින්නේ යයි ඇයට සිතෙයි. ඔහු දැන් පැමිණ සුපුරුදු අකීකරු විලාසයෙන් තමාගේ කොණ්ඩය අවුල් කර දමන්නේ නම්, සඟවාගත් ආදරය පිරුණ ඒ දෑසින් බලා සිටින්නේ නම්, දුම් රොටු පිට කරමින් ලෝකය පිළිබඳ බොහෝ කරුණු කාරණා කියා දෙන්නේ නම්, එතරම් සහනයක් තවත් වේද? මහ වරුසාවකින් ගැබ් ගත් වැවක් එක නිමේෂයකින් බිඳී යන්නාක් මෙන් නිරාශා ඉකි බිඳිමින් හඬන්නට පටන් ගත්තාය. විදුල නම් වන අකීකරු දරදඬු අහිංසකයා පිළිබඳ හදවත පිරී ගත් මහා ආදරය කඳුලට හැරී ගලා යද්දී නිරාශා දෑතින්ම හිස බදා ගත්වනම සිටියාය. හසන්ත ඇලදෙණිය ගේ දුරකතන ඇමතුම ආවේ ඒ අතරය.

"අලුත් ආරංචියක් තියෙනවද?" නිරාශා ඔහු කතා කරන්නට පෙරම ඇසුවාය. ඇගේ හැඬුම්බර ස්වරය ඔහු වහා හඳුනාගත්තේය. එනිසාම ඇගේ සිත පාරවන කිසිවක් මේ මොහොතේ නොකිව යුතු යයි ඔහු සිතුවේය.

"නැහැ.. කවුරුත් යමක් කියන්නෙ නැහැ.. මේ වැඩේ කළේ කවුද කියලා පොලිසිය දන්නවා.. ඒත් මොකක් හරි හේතුවක් නිසා හැමෝම කතා කරන්නෙ කොලේ වහලා.."

"මට තේරෙන්න නැහැ හසන්ත .. අපි දැන් මොකක්ද කරන්න ඕනෙ කියල මට හිතාගන්න බැහැ.. අයි ඈම් කන්ෆියුස්ඩ්" ඈ යළි ඉකිබින්දාය.

"හිත කලබල කරගන්න එපා.. මේ වෙලාවෙ අපට හිතන්න තියෙන්නෙ විදුල සනීප කරගන්න එක ගැන විතරයි.. අනිත් සේරම දෙවෙනුවට තියෙන දේවල්.. අපට වැදගත් විදුලගෙ ජීවිතේ විතරයි.. කළේ කවුද කළේ ඇයිද කියල අපි දෙවෙනුවට හොයා ගමු"

"ලොකු තැන් වලින් නියෝග කෙරුණොත් මේක පිටිපස්සෙ ඉන්නෙ කවුද කියලා හොයාගන්න බැරිවෙන එකක් නැහැ.. ඔයාට ඒක කරන්න පුලුවන් නේද හසන්ත?"

හසන්ත පිළිතුරක් නොදී කල්පනාවට වැටුණේය. මේ සමස්ථ ක්‍රියාදාමය පිළිබඳ තමා අනුමාණ කරන සියල්ල ඇයට කෙසේ නම් කියන්නදැයි ඔහුට නොදැනෙයි. වඩාත්ම සුදුස දෙය වන්නේ නිශ්ෂබ්දතාව රැකීමයි. එළි කළ හැකි දේත් නොකළ හැකි දේත් නිවී සැනසිල්ලේ කල්පනා කොට වර්ග කර ගත යුතුය. කලුගල් ඇත්තේ ඔලුව හප්පා ගැනීමට නොව මග හැරයාමට බව ඔහුගේ ව්‍යාපාරික ඥාණය කියා දී ඇත.

"තේරුමක් නැහැ නිරාශා.."

"ඇයි එහෙම කියන්නෙ.. විදුලට මේ කළ දේ අහම්බයක් නෙවෙයි.. සැළසුම් කළ එකක්.. කවුරු හරි කෙනෙකුට අවශ්‍ය වෙලා තියෙනවා එයාව නිශ්ෂබ්ද කරන්න.. ඒ කවුද කියල හොයා ගන්න එක අවශ්‍ය දෙයක් නෙවෙයිද..?"

එය අවශ්‍ය දෙයක් බව සැබෑය. එහෙත් අවශ්‍ය කාරණය පසුපස හඹා යාම තවත් කරදර රැසකට මුල වනු ඇති බව නිරාශාට කෙසේ නම් කියන්නද? තේරුම් කළ හැකි බොහෝ දෙයත් තේරුම් කළ යුතු බොහෝ දෙයත් අතර සමබරතාව රැකගන්නට හසන්තට අවශ්‍ය විය. ආවේගයට ඉඩ දිය යුතු වේලාව මෙය නොවේ. තත්තවය සන්සුන් වූ පසු ඇයට සියල්ල තේරුම් කර දිය හැකි වනු ඇත. දැන් කළ යුතු වන්නේ ඒ දක්වා ඇය කැඳවාගෙන යාම පමණකි.

"ඒව දැනට පැත්තකින් තියමු.." ඔහු කියයි. "..මම තව පැයකින් එන්නම්.. ලෑස්ති වෙලා ඉන්න.. ඩොක්ටර් සිරිවර්ධන පොරොන්දු වුණා හොස්පිටිල් එකේ අපි එනකල් ඉන්නම් කියල.."

0000000000000000

තමාගේ මේසය ඉදිරියේ වාඩි වී සිටිනා පුද්ගලයා කාමරයට ඇතුල්වත්ම මදාරා හඳුණාගත්තාය. ඔහුට නොදැනෙන ලෙස ආපසු හැරෙන්නට එක් මොහොතකට සිතුණද ඇය ඒ අදහස සැණින් වෙනස් කර ගත්තාය. ඔහු හා විසඳා ගන්නට ප්‍රශ්නයක් ඇත. එය කල් දැමිය නොහැකි බරපතල ප්‍රශ්නයකි. තමා ඔහු හමුවන්නට යන්නට පෙර ඔහු පැමිණ සිටීම යහපතකි.

මදාරා සිය පුටුවේ වාඩි වී සිය අත්බෑගය මේස ලාච්චුවකට දැමුවාය.
මේසය මත වූ සීනුව නාද කළාය. කාමරයේ දොරින් එබුණ ආරියසේනට "තේ දෙකක්" යයි අභිනයෙන් කීවාය. මදාරා තමා ඉදරියේ වූ පුටුවේ වාඩි වී සිටි තිසර සූරියබණ්ඩාර දෙස එක එල්ලේ බැලුවේ ඉන් පසුවය. ඔහු සිනාසෙන්නට අසාර්ථක උත්සාහයක් කළ ද ඔහුගේ මුහුණේ පැහැදිළිව ඇඳී තිබූ ව්‍යාකූලත්වය ඇගේ සිත පුදුමයට පත් කළේය.
සැමවිටම ආත්මාභිමානයෙන් ජ්වලිතව තිබෙන කථිකාචාර්යවරයාගේ මුහුණේ මෙවන් පරාජිත පෙනුමක් දැකීම ඇය බලාපොරොත්තු නොවූ දෙයකි විය.

ආරියසේන තේ කෝප්ප දෙක මේසය මත තබා ඉවත්ව යන තෙක් මදාරා නිහඬව සිටියාය.
"මං එන්න කලින් සර් ආව එක හොඳයි.." ඈ කීවාය. ඇගේ දෑස් තුළ නළියමින් තිබූ කෝපය ඔහු හැඳිනගත්තේ ය. ඒ ගිණියම් දෑස් මග හරිමින් ඔහු මේසය මත වූ තේ කෝප්පය අතට ගත්තේය.

"මදාර එයි කියළ මං හිතුවා.. ඒ එන්න ඇයි කියලත් මං දැනගෙන උන්නා.." ඔහු කීවේ තේ උගුරක් බීමෙන් පසුවය.

"ඒක හොඳයි සර්.. මට අහන්න අවශ්‍ය ප්‍රශ්නෙත් දන්නවා නම් උත්තරෙත් කෙලින්ම දෙන්න පුලුවන්නෙ.."

"මට කියන්න අවශ්‍ය දෙයක් තියෙනවා.. මං උදුලගෙ දේශනයට ගියේ හොඳ හිතින් නෙවෙයි කියන එක ඇත්ත .. දේශනයෙන් පස්සෙ කලබලේ පටන් ගත්තෙ මං දාපු මිනිස්සු කියන එකත් ඇත්ත.. ඒත් විදුලට ශාරීරික හානියක් කරන්න මගේ තුන් හිතකවත් තිබුණෙ නැහැ.. ස්ටේජ් එකට නැග්ගෙත් විදුලට ගැහැව්වෙත් කව්ද කියල මං දන්නෙ නැහැ මදාරා.. ඒ කිසිකෙනෙක් මං අඳුනන්නෙ නැහැ."

"බොරු කියන්න එපා මිස්ටර් සූරියබණ්ඩාර.. මේ හැම දෙයක්ම කළේ ඔයා.. ඔයාට ඕනෙ වුණා විදුලගෙ ගමන නවත්තන්න.. ඔයා හිටියෙ විදුලට බයවෙලා.. හරියටම කියනවා නම් විදුලගෙ ෆිල්ම් එකට බයවෙලා.." මදාරා කීවේ නොසඟවාගත් කෝපයෙනි. මෙවර හිස එසවූ තිරස සූරියබණ්ඩාර ඇය දෙස එක එල්ලො බැලුවේය.

"බම්බුව.. මෝඩ ගෑනියෙක් වගේ කෑ ගහන්න එපා මදාරා.. මං එහෙම දෙයක් කළා නම් මේ වගේ තමුසෙ හම්බවෙන්න එනවද?"

"ඇයි නැත්තෙ .. කරන්න තියෙන ඕනෙම පාහර වැඩක් කරලා මොකුත් නොදන්නවා වගේ රඟපාන්න ඔහේ නොදන්නවා නොවෙයිනෙ.. නිදහසට කාරණා කියන්න මං හමුවෙන්න ආවෙ හිතේ ගිල්ටියක් තියෙන නිසයි"

"මං ආවෙ ඔහේ මාව සැක කළ බව දන්න නිසයි.. නැතුව නිදහසට කාරණා කියන්න නෙවෙයි.. මම යමක් කළා නම් තමුසෙ ඉස්සරහ නිදහසට කාරණා කිව්වයි කියල නීතියෙන් පොලිසියෙන් මට ගැලවීමක් ලැබෙන්නෙ නැහැනෙ.."

"පොලීසිය.." මදාරා උපහාසයෙන් සිනාසුණාය. "..පොලිසියත් ඔයාලගෙ නීතියත් ඔයාලගෙ යුක්තියත් ඔයාලගෙ.. ඔයා දැන් කතා කළ කෙහෙල්මල් එකක් වත් මට වැඩක් නැහැ මිස්ටර් සූරියබණ්ඩාර.. මට දැනගන්න ඕනෙ වුණේ මේ පාහර වැඩේ ඔහේ කළාද නොකළාද කියන එක නෙවෙයි... මට දැනගන්න ඕනෙ වුණේ මේ පාහර වැඩේ කළේ ඇයි කියන එක විතරයි.. කරුණාකරලා අන්න ඒකට මට උත්තරයක් දෙන්න.. "

"ඒක මට අදාල ප්‍රශ්නයක් නෙවෙයි මදාරා.. මං ඒ වැඩේ කළේ නැහැ.. මිනිහෙක් මරන්න හරි මරවන්න හරි ඒ වෙනුවෙන් උත්සාහ කරන්න හරි මට බැහැ.. ඔයා කැමති විදිහකට තේරුම් ගන්න.. මට අවශ්‍ය වුණේ විදුල අධෛර්ය කරන්න විතරයි.. එයාට විරුද්ධව විශාල සමාජ බලවේගයක් තියෙනවා කියලා එයාට පෙන්නලා දෙන්න විතරයි.. එහෙම කරලා එයා අපට මඩ ගහන්න කරන නිර්මාණ නවත්තන්න විතරයි.."

මදාරා උපහාසයෙන් සිනාසුණාය.

"උගත් කථිකාචාර්යවරයෙක් කියලා පෙන්නගෙන හිටියට බලනකොට ප්‍රායෝගිකව ඔයා හරිම මෝඩ මනුස්සයෙක්නෙ.." මදාරා කීවේ ඒ උපහාසාත්මක සිනාව රැඳුණ මුවින්මය. "..විදුල වගේ පදනමක් තියෙන.. අරටුවක් තියෙන.. තමන් කරමින් ඉන්නෙ මොකක්ද කියලා හොඳින් දැනුවත්ව ඉන්න නිර්මාණකාරයෙක්ව ඔය විදිහට නිශ්ෂබ්ද කරන්න පුලුවන් කියලා හිතන්න පුලුවන් වෙන්නෙ මේ ලෝකෙ ගැන මෙලෝ ප්‍රායෝගික දැනීමක් නැති මෝඩයෙකුටම විතරයි මිස්ටර් සූරියබණ්ඩාර.. දැන් කොලේ වහලා